පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# අවසාන වාර පරීක්ෂණය - 2022

ශ්‍රේණිය **09**

විෂයය :- **පුරවැසි අධ්‍යාපනය I , II**

පාසලේ නම : ..........................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : **පැය 02 යි.**

## 1 පත්‍රය

**සැලකිය යුතුයි,**

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

❖ **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී ලබා දී ඇති පිළිතුරු අතරින් වඩා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) සමාජයක මූලික තැනුම් ඒකකය වන්නේ,

(1) පාසල ය. (2) පන්සල ය. (3) පවුල ය. (4) පල්ලිය ය.

(02) ඇමරිකා එක්සත් ජනපදයේ පැවති වහල්භාවය ඉවත් කිරීමට කටයුතු කළ ජනාධිපතිවරයා වන්නේ,

(1) ඒබ්‍රහම් ලින්කන් ය. (2) මහත්මා ගාන්ධි ය. (3) ෆ්‍රැන්සිස් බේකන් ය. (4) ශ්‍රීමත් රිචඩ් ස්ටීල් ය.

(03 සියලු දෙනාම අවනත විය යුතු, රාජ්‍යය විසින් පනවනු ලබන සමස්ත රෙගුලාසි පද්ධතිය සරලව හඳුන්වන්නේ,

(1) සංස්කෘතිය (2) ආගම (3) සමාජය (4) නීතිය

(04) හදිසි අවස්ථාවක දී පොලීසිය දැනුවත් කල හැකි සෘජු දුරකතන අංකය වන්නේ,

(1) 1111 (2) 119 (3) 1929 (4) 1990

(05) ශ්‍රී ලංකාවේ වර්තමාන රැකියා වෙළඳපොළේ ප්‍රධාන අංශ දෙක වන්නේ,

(1) දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපොළ (2) කෘෂිකාර්මික හා කාර්මික වෙළෙඳපොළ

(3) සේවා හා කාර්මික රැකියා වෙළෙඳපොළ (4)ග්‍රාමීය හා නාගරික රැකියා වෙළෙඳපොළ

❖ **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති වගන්ති සත්‍ය නම් ( √) ලකුණ ද, අසත්‍ය නම් ( ×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(06) සාමූහිකව කටයුතු කිරීම ජන සමාජයක දැකිය හැකි මූලික ලක්ෂණයකි. (.......)

(07) සමූපකාර ව්‍යාපාරයේ අරමුණක් වන්නේ තනි තනිව තමන්ගේ කටයුතු කර ගැනීමට හැරීම යි. (.......)

(08) ''සුරකිමු ලකඹර '' ශ්‍රී ලංකාවේ නාවික හමුදාවේ ආදර්ශ පාඨය යි. (.......)

(09) කාල කළමනාකරණය හා මූල්‍ය කළමනාකරණය සාර්ථක ජීවිතයකට අත්‍යාවශ්‍ය වේ. (.......)

(10) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව දේශීය හා අන්තර්ජාතික නීතිය වශයෙන් කොටස් දෙකක් ලෙස දැකිය හැකි ය. (.......)

❖ **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට "අ" කොටසේ ඇති ප්‍රකාශයට ගැළපෙන පිළිතුර "ආ" කොටසින් තෝරා යා කරන්න.**

| | |
|---|---|
| (11) රාජ්‍යය පාලනය සම්බන්ධ මූලික සිද්ධාන්ත ඇතුළත් උත්තරීතර නීතිය | අන්‍යෝන්‍ය රැඳියාව |
| (12) තම කටයුතු පහසු කර ගැනීමට මිනිසා යොදා ගන්නා ක්‍රමවේදය | බහුසංස්කෘතික රටකි |
| (13) ශ්‍රී ලංකාව අතීතයේ සිට ම | තාක්ෂණය |
| (14) එකිනෙකාට උදව් කර ගනිමින් සහයෝගයෙන් කටයුතු කිරීම | ඵලදායීතාව |
| (15) සීමිත සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |

❖ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරා ලියන්න.**

( ජපන් , මහත්මා ගාන්ධිතුමා , සෘජු , මර්සිලීන් ජයකොඩි , මකරා , චක්‍ර )

(16) තීන්දු ගැනීමේ හා පාලන කටයුතුවලට පුරවැසියන් සෘජුවම සම්බන්ධ වීම ......................... ප්‍රජාතන්ත්‍රවාදය නම් වෙයි.

(17) ආගම් අතර සහජීවනය ඇති කිරීමට කටයුතු කළ බැවින් ................................ පන්සලේ පියතුමා ලෙස හැඳින්වී ය.

(18) හිසනමා ආචාර කිරීම ................ සංස්කෘතියට අනන්‍ය වූ සිරිතක් වේ.

(19) තමන් ගේ ඇඳුම තමන් විසින් ම සකසා ගනිමින් ................. දේශීය නිෂ්පාදන භාවිත කිරීමට ජනතාවට ආදර්ශයක් ලබා දුන්නේ ය.

(20) චීනය ................. මුල් කර ගත් සංස්කෘතික අංග රැසක් අනුගමනය කරයි.

( ලකුණු 2 × 20 = 40)

## 11 පත්‍රය

❖ **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
❖ **අනිකුත් ප්‍රශ්න අතුරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
❖ **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

(01) i) A , B , C , D පින්තූරවලින් දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ විවිධ ජන වර්ගවලට අයත් සංස්කෘතික අංග කිහිපය කි. ඒවා කුමන ජන වර්ගයට අයත් ද යන්න අනුපිළිවෙලින් ලියා දක්වන්න. ( ලකුණු 2 × 4 = 08 )

A



B



C



D



ii) සහජීවන ගුණාංග දෙකක් ලියන්න. ( ලකුණු 02 )

iii) ඔබට හිමිවන අයිතිවාසිකම් දෙකක් A,B හා C වලින් දක්වා ඇත. එම අයිතිවාසිකම්වලට අනුව ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් එක බැගින් A B C අනුපිළිවෙලින් ලියන්න.

A. අධ්‍යාපනය ලැබීමේ අයිතිය

B. තමන් කැමති ආගමක් ඇදහීමේ අයිතිය

C. ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය (ලකුණු 03)

iv) පහත A , B හා C පින්තූරවලින් දක්වා ඇත්තේ රැකියා සඳහා තෝරා ගැනීමේ දී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ ආකාර තුනකි. පින්තූරයට අනුව සම්මුඛ පරීක්ෂණය කුමක්දැයි A, B , C අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A



B



C



( ලකුණු 03 )

(02) සමාජ සුරක්ෂිතතාවය සඳහා දායක වන ආයතනයක් විසින් ලබා දෙන සේවයක් මෙම රූපයෙන් දැක්වෙයි.



i) ඉහත පින්තූරයේ දැක්වෙන ආයතනය සහ ලබා දෙන සේවාව කුමක්දැයි සඳහන් කරන්න. (ලකුණු 02)

ii) නීතියේ මූලාශ්‍ර හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii) ක්‍රියාත්මක වන ආකාරය අනුව නීතියේ ප්‍රධාන ආකාර දෙක නම් කර ඉන් එක් නීති වර්ගයක් කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 05)

(03) නවීන තාක්ෂණය භාවිත කරන අවස්ථා දෙකක් පින්තූරවලින් දැක්වෙයි.

A



B



i) ඉහත A හා B ක්ෂේත්‍ර අනුපිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

ii) තාක්ෂණය වෙනස්වීම සමඟ ඇති වන හිතකර බලපෑම් දෙකක් හා අහිතකර බලපෑම් දෙකක් ලියන්න. (ලකුණු 04)

iii) වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුවට තාක්ෂණය බලපා ඇති ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(04) i) ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යනු කුමක්දැයි ඉතා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

iii) ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය තීරණය වීම කෙරෙහි බලපාන සාධක දෙකක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(05) i) පහත දී ඇත්තේ ශ්‍රී ලංකාවේ මුලින් ම ආරම්භ කළ මහනගර සභා දෙකකි. ඒවා හඳුනාගෙන A හා B අනුපිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

A



B



ii) පළාත් පාලන ආයතනයක ප්‍රධානියා සතු බලතල හතරක් ලියන්න. (ලකුණු 04)

iii) පළාත් පාලන ආයතනවලින් ඉටු කෙරෙන සේවා දෙකක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න (ලකුණු 05)

(06) i) ගැටම් ඇති වීමට බලපාන හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

ii) ගැටුම් නිරාකරණය කරන්නෙකු සතු ගුණාංග හතරක් ලියන්න. (ලකුණු 04)

iii) ගැටුම් ශුභවාදීව නිරාකරණය කිරීමේ වාසි දෙකක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) i) පහත පින්තූරවල දැක්වෙන රැකියා කුමන වර්ගයට අයත්දැයි වරහන තුළින් තෝරා AB අනුපිළිවෙලින් ලියන්න.

( එළිමහන් , ගෘහස්ථ , ස්ථිර , ජංගම ) (ලකුණු 02)

A



B



ii) වැඩ ලෝකය තුළ වෘත්තීය පුහුණුව ලබා ගත හැකි ආයතන හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii) සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය - පුරවැසි අධ්‍යාපනය

ශ්‍රේණිය -09 පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 1) 3 | 6) √ | 11) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | 16) ඍජු |
| 2) 1 | 7) × | 12) තාක්ෂණය | 17) මර්සිලින් ජයකොඩි |
| 3) 4 | 8) × | 13) බහු සංස්කෘතික | 18) ජපන් |
| 4) 2 | 9) √ | 14) අන්‍යෝන්‍ය රැඳියාව | 19) මහත්මා ගාන්ධි |
| 5) 1 | 10) √ | 15) ඵලදායිතාව | 20) මකරා |

## II කොටස

01) i . A - වැදි ජනයා

B - මුස්ලිම් ජනයා

C - දෙමළ ජනයා

D - සිංහල ජනයා

ii . සහයෝගයෙන් කටයුතු කිරීම,බෙදාහදා ගැනීම,අන්‍යයන්ට ගරු කිරීම,සුහද බව, අන්‍යෝන්‍ය විශ්වාසය, අවංක බව,සුබවාදී වීම, යුතුකම් ඉටු කිරීම

iii. A - හොඳින් අධ්‍යාපනය ලැබීම.

B - අන්‍ය ආගම්වලට ගරු කිරීම / පූජ්‍ය පූජක උතුමන්ට ගරු කිරීම හා සැලකීම

C - මැතිවරණ නීතිවලට අනුකූල වීම

iv. A - නිපුණතා මැන බැලීමේ පරීක්ෂණ.

B - මණ්ඩලයක් මගින් කෙරෙන සම්මුඛ පරීක්ෂණ.

C - තනි පුද්ගලයෙකු විසින් කෙරෙන සම්මුඛ පරීක්ෂණ.

02) i . ආයතනය - පොලීසිය

සේවය - පාර මාරු වීමට උදවු කිරීම / මාර්ගවල රථවාහන හැසිරීම

ii . ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අධිකරණ තීරණ, ව්‍යවස්ථා ( අණපනත්) , නීති විශාරදයින් ගේ මත , සිරිත් විරිත්

iii. දේශීය නීතිය - රටක් තම දේශ සීමාව තුළ බලපැවැත්වෙන පරිදි පනවනු ලබන හා ක්‍රියාත්මක කරනු ලබන නීති දේශීය නීති වශයෙන් හැඳින්වේ.දේශීය නීතිය රටකින් රටකට වෙනස් වේ.

අන්තර්ජාතික නීතිය - එක් රටක් තවත් රටක් සමග හෝ රටවල් කිහිපයක් සමග හෝ සම්බන්ධ වී කටයුතු කිරීමේ දී බල පවත්වන නීතිය අන්තර්ජාතික නීතිය ලෙස හැඳින්විය හැකි ය.

03) i . A - කෘෂිකාර්මික ක්ෂේත්‍රය B - ප්‍රවාහන ක්ෂේත්‍රය

ii . හිතකර බලපෑම් - වැඩ පහසු වීම,කාලය ඉතිරි වීම, ඵලදායිතාව වැඩි වීම, සම්පත් නාස්තිය අවම වීම,මානව හා සමාජ සම්බන්ධතා පුළුල් වීම.

හිතකර බලපෑම් - මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම,මිනිසා අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම, මිනිසුන් යාන්ත්‍රීකරණය වීම, සමාජය සංකීර්ණ වීම, පරිසර දූෂණය වේගවත් වීම, මිනිසා විවිධ ලෙඩ රෝගවලට ගොදුරු වීම, සමාජ සම්බන්ධතා බිඳ වැටීම

iii. අතීතයේ වැලි පීල්ල හා ගල් ලෑල්ල ආදිය භාවිත කරන ලදි. වර්තමානයේ තාක්ෂණික දියුණුවත් සමග ගුවන් විදුලිය , රූපවාහිනිය, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ, පරිගණක , ජංගම දුරකතන ආදිය භාවිත කිරීම. එමෙන්ම අන්තර් ජාලය භවිත කරමින් තොරතුරු සොයාගත හැකි වීම

04) i . මහජන කැමැත්ත පදනම් කර ගෙන ගොඩනැගී ඇති පාලන ක්‍රමය / මහජනතාවගේ පාලනය

ii . නීතියේ ආධිපත්‍යය, අදහස් ප්‍රකාශනයේ නිදහස, නිදහස් ජන මාධ්‍ය පැවතීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාලනය කිරීම , සර්ව ජන ඡන්ද බලය ක්‍රියාත්මක වීම,නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත් වීම ( පෙළපොතේ පිටු අංක 71 )

iii. ජනතාවගේ දේශපාලන දැනුම හා අවබෝදය ඉහළ මට්මක පැවතීම

පාලකයන් තෝරා පත් කර ගැනීමේ දී ජනතාව බුද්ධිමත් තීරණ ගැනීම

කැපවීමෙන් කටයුතු කරන අවංක හා උදාර නායකත්වයක් පැවතීම

ජනමාධ්‍ය නිදහස ක්‍රියාත්මක වීම, රට තුළ නීතියේ ආධිපත්‍යය පැවතීම (පෙළපොතේ පිටු අංක 72 )

05) i . A - ගාල්ල මහනගර සභාව B - කොළඹ මහනගර සභාව

ii .සභාව කැඳවීම හා කල් තැබීම, සභාවේ මුලසුන දැරීම,මහජන උපයෝගීතා සේවා සැපයීමට මුල් වීම, පළාත් පාලන ආයතන සතු කටයුතු සංවිධානය හා මෙහෙය වීම

iii.පුස්තකාල, කියවීම් ශාලා ,ළමා උද්‍යාන ,ව්‍යායාම හා ඇවිදින මං තීරු,පෙර පාසල් , ප්‍රාදේශීය මාර්ග නඩත්තුව,මළපවාහන ගලි සේවය, පොදු ළිං, මාතෘ හා වෛද්‍ය සායන

(පෙළපොතේ පිටු අංක 101 සිට 104 දක්වා )

(06) i. නොගැලපෙන අදහස්, සමාජානුයෝගී නොවීම, ආත්මාර්ථකාමී බව, නූගත්කම

(පෙළපොතේ පිටු අංක 113 )

ii. ඉවසීම, සක්‍රීය සවන්දීම, කාරුණික බව, සුහදශීලි බව, අන්‍ය අදහස්වලට ගරු කිරීම, පරිත්‍යාගශීලී බව, මධ්‍යස්ථ බව. (පෙළපොතේ පිටු අංක 116 )

iii. සාමය ස්ථාපිත වීම, පුද්ගල හා සමාජ සංවර්ධනයට හේතු වීම, දේශපාලන ස්ථාවර භාවය, සම්පත් නාස්තිය අවම වීම ( පෙළපොතේ පිටු අංක 118 සිට 119 )

07) i . A - ගෘහස්ථ B - එළිමහන්

ii.කාර්මික විද්‍යාල,වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව මණ්ඩලය, හෝටල් පාසල් ,නීති විද්‍යාලය,හෙද විදුහල්

( පෙළපොතේ පිටු අංක 129)

iii. පෞද්ගලික පෙනුම, ශරීර භාෂාව, අවධානය හා උනන්දුව, කථනය හා බස හැසිරවීම, ආචාරසම්පන්න වීම ( පෙළපොතේ පිටු අංක 147)

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**